# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

# නීතිවේදී ගෞරව උපාධි පාඨමාලාව 2022/2023

| මධ්‍යස්ථානය | වෙන් කර ඇති ශිෂ්‍ය සංඛ්‍යාව | මාධ්‍යය | | |
|---|---|---|---|---|
| | | සිංහල | ඉංග්‍රීසි | දෙමළ |
| කොළඹ | 200 | √ | √ | √ |
| මහනුවර | 120 | √ | √ | √ |
| මාතර | 75 | √ | - | - |
| අනුරාධපුරය | 75 | √ | - | - |
| යාපනය | 75 | - | - | √ |
| මඩකලපුව | 75 | - | - | √ |
| බදුල්ල | 40 | √ | - | √ |
| කුරුණෑගල | 45 | √ | - | - |
| රත්නපුර | 45 | √ | - | - |

එක් එක් ප්‍රාදේශීය මධ්‍යස්ථානයට වෙන් කර ඇති ශිෂ්‍ය සංඛ්‍යාව හා එකී මධ්‍යස්ථානවල පාඨමාලාව පවත්වනු ලබන භාෂා මාධ්‍යයන් ඉහත සඳහන් පරිදි වේ.

1. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ඉහත දැක්වෙන උපාධි පාඨමාලාවට තෝරා ගැනීමේ පරීක්ෂණය සඳහා අයදුම්පත් **2022 නොවැම්බර් මස 10 වන දින සිට 2022 දෙසැම්බර් මස 10 වන** දින දක්වා නිකුත් කරනු ලැබේ.
2. පහත දක්වා ඇති අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් අතරින් කිසියම් හෝ සුදුසුකමක් ලබා ඇති වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පුද්ගලයන් මෙම පාඨමාලාවට අයදුම් කිරීම සඳහා යෝග්‍යතාව ලබයි.
   - අ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ඕනෑම විෂය ධාරාවක විෂයයන් තුන (03) එකවර සමත්ව තිබීම, **හෝ**
   - ආ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (විෂයන් හතරක් (04) සහිත පැරණි නිර්දේශය යටතේ) විෂයයන් හතරක් (04) ක් සමත්ව තිබීම, අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් තුනක් (03) සමත් වී තිබිය යුතුය (එකම විෂය ධාරාවේ විය යුතුය), **හෝ**
   - ඇ. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමන කවර හෝ පාඨමාලාවක SLQF දෙවන මට්ටමේ පාඨමාලාවක සම්මාන 30 හෝ ඊට වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ කර තිබීම, **හෝ**
   - ඈ. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් වන අයදුම්කරුවන් මෙම උපාධි පාඨමාලාවේ 4 වන මට්ටම සඳහා ඍජුවම සුදුසුකම් ලබන අතර ඔවුන් තෝරා ගැනීමේ පරීක්ෂණයෙන් හා පාඨමාලාවේ 3 වන මට්ටමෙන් නිදහස් වේ. ඔවුන් තෝරා ගත් අනෙකුත් ශිෂ්‍යයන් සමඟ 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි විය යුතුය. කෙසේ වුවද 4 වන මට්ටම සඳහා නව විෂය නිර්දේශයේ අධ්‍යයන කටයුතු 2023/2024 අධ්‍යයන වර්ෂයේ ආරම්භ වේ. එමනිසා නීතිඥවරුන් වන අයදුම්කරුවන් ඔවුන්ගේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම සඳහා 2023/2024 වර්ෂය තෙක් සිටිය යුතුය, **සහ**
   - ඉ. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සනාථන සභාව විසින් පිළිගනු ලබන ඉහත සඳහන් කළ සුදුසුකම්වලට සමාන හෝ ඉහළ සුදුසුකමක් ලබා තිබීම.

   උපාධි පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන්නේ ඒ සඳහා පවත්වනු ලබන තරගකාරී තෝරාගැනීමේ විභාගයේ ප්‍රතිඵල මතය. මෙම තෝරාගැනීමේ පරීක්ෂණය **2023 ජනවාරි මස 08 වන** දින පවත්වනු

   * තෝරාගැනීමේ පරීක්ෂණය සඳහා ප්‍රවේශ පත්‍රය, **2022 දෙසැම්බර් 12 වන දින සිට 2023 ජනවාරි 8 වන** දින දක්වා බාගත කළ හැකිය. අයදුම්පත් ගාස්තු ගෙවූ අයදුම්කරුවන් වෙත IT Help Desk මගින් කෙටි පණිවිඩයක් සහ ඊ-මේල් යන මාර්ග දෙක හරහාම ප්‍රවේශ පත්‍රය බාගත කර ගැනීමේ දිගුව (Link) එවනු ඇත. පරීක්ෂණය සඳහා ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබන්නේ අයදුම්පත් භාරගන්නා අවසන් දිනයෙන් පසුවය.
3. උපාධි පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන්නේ ඒ සඳහා පවත්වනු ලබන තරගකාරී තෝරාගැනීමේ විභාගයේ ප්‍රතිඵල මතය. මෙම තෝරාගැනීමේ පරීක්ෂණය **2023 ජනවාරි මස 08 වන** දින පවත්වනු ලැබේ.
4. අයදුම්පත්‍රය අන්තර්ජාලය මගින් පමණක් ලබාගත හැකි අතර අන්තර්ජාලය මගින් අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම හා යොමු කිරීම පිළිබඳ වගකීම අයදුම්කරුවන් සතු වේ. කිසිදු තත්වයක් යටතේ මුද්‍රිත අයදුම්පත්‍ර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් භාරගනු නොලැබේ.
5. අපේක්ෂකයින් තමන් අධ්‍යයන කටයුතු කරගෙන යාමට බලාපොරොත්තු වන ප්‍රාදේශීය මධ්‍යස්ථානය තම අයදුම් පත්‍රයෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. අධ්‍යයන පාඨමාලාව ආරම්භ කිරීමෙන් පසු හෝ පාඨමාලාව අතරතුර දී කිසිදු හේතුවක් මත තමන් විසින් තෝරාගනු ලැබූ ප්‍රාදේශීය මධ්‍යස්ථානය වෙනස් කිරීමට ලියාපදිංචි ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යාවකට අවසර ලබා නොදේ.
   - අ. තමාගේ ස්ථිර පදිංචි ස්ථානයට ආසන්නතම ප්‍රාදේශීය මධ්‍යස්ථානය අපේක්ෂකයන් විසින් තෝරාගත යුතුය.
   - ආ. තෝරාගනු ලැබූ අපේක්ෂකයන් විසින් පාඨමාලාව සඳහා ලියාපදිංචි වන අවස්ථාවේදී තමාගේ ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිළධාරීවරයා විසින් සහතික කරන ලද සහ ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම් විසින් තහවුරු කරන ලද ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
   - ඇ. ග්‍රාම නිළධාරීවරයා විසින් සහතික කරන ලද සහ ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම් විසින් තහවුරු කරන ලද ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතක් ඉදිරිපත් කිරීම ලියාපදිංචිය සඳහා අනිවාර්ය අවශ්‍යතාවක් වන අතර එය ඉදිරිපත් නොකරන අපේක්ෂකයින් තෝරාගැනීමේ විභාගයෙන් සමත් වුව ද පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු නොලැබේ.
   - ඈ. අපේක්ෂකයන් තම අධ්‍යයන කටයුතු සඳහා තෝරාගනු ලැබූ ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙහිදීම තෝරාගැනීමේ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය.
6. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර **https://www.ou.ac.lk** වෙබ් අඩවියට පිවිස එහි දක්වා ඇති තොරතුරු අත්පොත බාගත කර කියවන්න.
7. ඉහත පස්වන (05) පරිච්ඡේදය අනුව අපේක්ෂකයන් විසින් අයදුම්පතෙහි හෝ ඉදිරිපත්කරන ලද සහතිකවල සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය හෝ සාවද්‍ය බව හෙළි වුවහොත් ලියාපදිංචි කිරීම සඳහා කැඳවනු ලැබූ අපේක්ෂකයෙකු ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමේ සියලු අයිතිය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සතු වේ.
8. වැඩිදුර තොරතුරු සඳහා දුරකථන අංක **011-2881327/ 256** මගින් මහජන සම්බන්ධතා අංශය, **0112 881 432 / 0716 368 241** මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය අමතන්න.

**අයදුම් කිරීම අන්තර්ජාලයෙන් පමණි**

**අයදුම්පත් ගාස්තුව රුපියල් 5000/=**

**https://reginfo.ou.ac.lk/applyonline/ වෙබ් අඩවියට පිවිසීම මගින් ඔබට මෙම වැඩසටහන සඳහා අයදුම් කළ හැකිය.**

**අයදුම් කිරීම : 2022.11.10 සිට 2022.12.10 දක්වා**

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2022.12.10**

ලබාගත හැකි ශිෂ්‍යත්ව - මහපොල ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර, ප්‍රවර්ධන ශිෂ්‍යාධාර සහ බඳවා ගැනීමේදී දෙනු ලබන ශිෂ්‍යාධාර
(වැඩි විස්තර සඳහා ශිෂ්‍ය කටයුතු හා සුභසාධක අංශය අමතන්න - 0112881374)



**ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ.**